**2021 අගොස්තු මස 20 වන දින පැවති**

**හතළිස් වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.08.20**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **15.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **16.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **17.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **18.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණි බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **19.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **20.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **21.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා

**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමී වීරකෝන් මිය

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2021.07.20 මහ සභා කෙටුම්පත් වාර්ථාව**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.07.20 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.07.20 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> 2021.07.20 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>සංශෝදන</u>

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> මෙවර සභා වාර්තාව ගරු සභාපතිතුමා හා ලේකම්තුමා අපහසුතාවයට පත් වන සභා වාර්තාවක් වන සේම ගරු සභාපතිතුමා හා ලේකම්තුමා පරිශීලනය කර වරද නිවැරදි කල වාර්තාවක් තුල මෙම ඉදිරිපත් කරන සංශෝධන තිබීමේ හැකියාවක් නොමැති බවත්, සමස්ත වාර්තාවේ ගුණාත්මක තත්වය සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත්, සඳහන් කරමින් වාර්තාවේ මුදල් කමිටු නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබා දෙන, අවස්ථාව තුල තමා දැක්වූ අදහස් සහිත සටහන කිසිදු ගැලපීමක් නොමැතිව කරුණු එකින් එක වටහා ගැනීමේ පහසුවකින් තොරව සටහන් කර තිබෙන බැවින් එය අදහස නිවැරදි ලෙස වෙන් වෙන් වශයෙන් සටහන් විය යුතු බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද එම ප්‍රකාශය තුල නිදන්ගල මාර්ගයේ ප්‍රාදේශීය සභාවෙන් ඉදි කල කොටස සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් නොමැති බවත්, සභාවේ අනුමැතියකින් තොරව ජාතික ගොඩනැගිලි අමාත්‍යාංශය හරහා වෙනත් පුද්ගලයෙකු මාර්ගයෙන් කොන්ත්‍රාත් කල කොටස යන ප්‍රකාශයේ ජාතික ගොඩනැගිලි අමාත්‍යාංශය ලෙස පවතින සටහන ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය ලෙසට සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තවද ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා මාර්ගයේ කාණු කපා දීම යන 07 වන යෝජනාව තුල ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා අදහස් දැක්වීමට ප්‍රථම තමන් විසින් එම මාර්ගයේ දිග, පළල හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව විමසූ මුත් එය සටහන් වී නොමැති බව ප්‍රකාශ කරමින් එය සටහන් විය යුතු බව සඳහන් කරන ලදී.

මෙවැනි වැරදි පවතින සභා වාර්තාවක් සම්බන්ධයෙන් මීට වඩා වැඩි අවධානයක් යොමු කර විධිමත් කරන ලෙසට ප්‍රකාශ කරමින් සංශෝධන ඉදිරිපත් කිරීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> පළාත් පාලන ආයතන වල විපක්ෂ නායක යන තනතුර නොමැති බවට සඳහනක් ඇතත්, සත්‍ය ලෙසම පාර්ලිමේන්තුවේත්, පළාත් සභාවේත්, පළාත් පාලන ආයතන වලත්, විපක්ෂ නායක තනතුරක් පවතින බවත්, පනතේ එලෙස නම් කර නොතිබුනත්, ඉහත සඳහන් කල සෑම තැනකම විපක්ෂ නායක තනතුර පිහිටුවා ඇති බවත්, මුළු ලංකාවේම රාජ්‍ය නිලධාරීන් හා අතිගරු ජනාධිපතිතුමා පවා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වේදීත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වේදීත් රැස්වීම් සඳහා කැඳවීමේදී ගරු සභාපතිතුමා වෙත හා විපක්ෂ නායකතුමා වෙතට පමණක් පැමිණීමට ආරාධනා කරන බවත්, මෙම තනතුර අනාගතය වෙනුවෙන් පවා රැක ගැනීම සිදු කළ යුතු බවත්, මෙවර මෙම ප්‍රාදේශීය සභාවේ වර්තමානයේ විපක්ෂයේ බහුතර ආසන ප්‍රමාණයක් එක්සත් ජාතික පක්ෂය සතුව පැවතිමේදී 2002 වසරේ සිට අඛණ්ඩ සේවා කාලයක් හිමි ඩී.පී බන්දුලසේන මැතිතුමා සභාපති ලෙස මීට ඉහතදී ධූරය දැරුවත් තමන් විපක්ෂයේ ජ්‍යෙෂ්ඨතමයා විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

තවද ජී ඒ නෙළුම් මැතිණිය එක්සත් ජාතික පක්ෂය තුළ සාමාජිකත්වය දරන බැවින් එතුමියට හිමි ස්ථානය ලබා දෙන ලෙස ද ප්‍රකාශ කරන ලදී.

තව දුරටත් අසහස් දැක්වූ ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා මේ වන විට අනුමත වී ඇති ව්‍යාපෘති 34 තුල ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ව්‍යාපෘති 2 බැගින් 22 ක් අධ්‍යයනය කිරීම සඳහා ලබා දී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සඳහා ව්‍යාපෘතිය බැගින් ව්‍යාපෘති 10 ක් අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ප්‍රකාශ කරමින් යන ප්‍රකාශය මේ වන විට අනුමත වී ඇති ව්‍යාපෘති 34 තුල ආණ්ඩුපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට ව්‍යාපෘති 2 බැගින් 22 ක් අධීක්ෂණය කිරීම සඳහා ලබා දී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සඳහා ව්‍යාපෘතිය බැගින් ව්‍යාපෘති 10 ක් අධීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ප්‍රකාශ කරමින් ලෙසට සංශෝධනය විය යුතු බවට ප්‍රකාශ කරන ලදී.

තවද 2002 වර්ෂයේදී තුරුවිල සමූහ නගර ජල ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී බල ප්‍රදේශයේ යම් යම් ගම්මාන හා කොට්ඨාශ ජල සම්බන්ධතාවය ලබා ගත නොහැකිව ඉතුරු වූ බවත්, එම අවස්ථාවේදී ග්‍රාමීය ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වුවද ජල සම්පාදන මණ්ඩලය මගින් සිදු කරන පිරිසිදු කිරීම් එම ව්‍යාපෘති මගින් සිදු නොවූ බැවින් ජනතාව ජල සම්පාදන මණ්ඩලය මැදිහත් වී ලබා දෙන ජලය 100% හොඳ බවට විශ්වාස කල බවත් සඳහන් කරමින් ඒ සඳහා ප්‍රමාණවත් ජලය නොතිබීම හේතුවක් වූ සේම මේ වන විට රාජාංගනය ජල ව්‍යාපෘතිය මගින් බල ප්‍රදේශයේ ජනතාවට ලබා දිය නොහැකි වූ ගම්මාන සඳහා අවශ්‍ය ජල ධාරිතාවය හිමි කරන්ගෙන ඇති බැවින් බල ප්‍රදේශයේ ජලය නොමැතිව හුදෙකලා වූ ගම්මාන හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය ජල අවශ්‍යතාවය සැපයීම සඳහා ප්‍රාදේශීය සභාවක් ලෙස සාධනීය මැදිහත්වීමක් ජල සම්පාදන අමාත්‍යවරයා සමඟ සිදු කරන ලෙස දීර්ඝ ලෙස කරුණු දක්වමින් ප්‍රකාශ කරන ලදී. යන ප්‍රකාශ තුලට එක්තරා දේශපාලන සංවිධානයක් කොඩිගල ජනපදය තුල ග්‍රාමීය ජල ව්‍යාපෘතියක් ස්ථාපිත කළ නමුත් ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ජල සම්බන්ධතාවය ලබා දීමට ගිය අවස්ථාවේදී අපේක්ෂිත ප්‍රදේශයට ජලය ලබාදීම ප්‍රතික්ෂේප වූ බවත් එවැනි හුදකලා වූ ගම් ගම්මාන සඳහා වහාම සොයා බලා ජලය ලබා දීම සඳහා මැදිහත්වීම සිදුකරන ලෙස ප්‍රකාශ කරන ලදී.යන ප්‍රකාශයද ඇතුලත් වී සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2021.07.20 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය**

**01. නිවාඩු දැනුම් දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා , ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා ,ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**02. 2020 වර්ෂයේ විගණන මතය ප්‍රකාශයට පත් කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය , මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සමග සංශෝධිත ව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා

නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශ වලින් 2020 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පලාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ යන මතය සභාවට නිවේදනය කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර් එම් කුමාරසිංහ මැතිතුමා</u> විගණන මතය ඉදිරිපත් කිරීමට ප්‍රථම විගණන විමසුම ඉදිරිපත් කළ යුතු බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද මේ වන විට ලබාගෙන ඇති මතය සම්බන්ධයෙන් සතුටු වන නමුත් තත්ත්වාගණනය නොකළ මතයක්ද පවතින බැවින් එවැනි මතයක් ලබා ගැනීමට උත්සහ කරන ලෙසත් විගණන විමසුම හා විගණන මතය ඡායා පිටපත් ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා</u> අදාල ඡායා පිටපත් ලබාදීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

### 03. මහජන ක්‍රීඩා පිටි ප්‍රමිතිගතව සංවර්ධනය කිරීමේ ජාතික වැඩ වැඩසටහන 2021

<u>ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා</u> ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහනට අදාළව මෙම සභා බල ප්‍රදේශයට අයත් ශ්‍රාවස්තිපුර කොට්ඨාශයේ ආතර් සිල්වා ක්‍රීඩාංගනය සම්බන්ධයෙන් ශක්‍යතා වාර්තාවක් කඩිනමින් ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ඉල්ලා ඇති බවට වූ ලිපිය සභාවට නිවේදනය කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ක්‍රීඩා පිටිය සම්බන්ධයෙන් සක්‍යතා වාර්තාවක් සකස් කරනවා නම් ඒ සම්බන්ධයෙන් මහා සභාවේ දී සාකච්ඡා කළ යුතු බවත්, මෙම බල ප්‍රදේශයට පමණක් නොව අනුරාධපුර දිස්ත්‍රික්කයේ වටිනාම ක්‍රීඩා පිටිය මෙය වන බැවින් හිමිවන ප්‍රතිපාදනය මගින් කරන්නේ මොනවාද යන්න සම්බන්ධව නිවැරදිව ප්‍රමුඛතාගත කිරීමකට නම් මෙය මහා සභාව තුළ සාකච්ඡා කළ යුතු ම වන බවත් එසේ නොමැති වුවහොත් ඉදිරියේදී ගැටලු මතුවිය හැකි බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> එය එසේ කිරීම වඩාත් සුදුසු බව සඳහන් කරමින් සක්‍යතා අධ්‍යයන වාර්තාව සඳහා ගරු සභාපතිතුමා ඇතුලත් කරනු ලබන්නේ කුමන කාරණා ද යන්න වග ගරු සභිකවරු සියලු දෙනා දැනගත යුතුම වන බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු අමාත්‍යතුමා සමග ඒ ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයේ ක්‍රියාකාරී ක්‍රීඩකයන් එකතු කර ගනිමින් ප්‍රදේශයේ මහජන නියෝජිතයන් සමග ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සම්බන්ධව සාකච්ඡාවක් පැවැත් වූ බව සඳහන් කරමින් ඔවුන් විසින් ලබා දුන් සැළැස්ම හා ඉල්ලීම සැළකිල්ලට ගෙන ඇස්තමේන්තු සකස් කිරීමට කාර්මික නිළධාරී මහතා වෙත උපදෙස් ලබා දුන් බවද සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ගරු අමාත්‍යතුමා අදාල ක්‍රීඩාංගනය නිරීක්ෂණය සඳහා සහභාගී වූ බවත්, ඒ අවස්ථාව සඳහා ක්‍රීඩා සමාජයේ ක්‍රීඩකයන් හා ගරු මහජන නියෝජිතයන් සහභාගී වන

ලෙසට දැනුම් දුන් බවත්, ඒ සඳහා ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සහභාගී වූ බවත් ක්‍රීඩකයන් වෙතින් අදාල අවශ්‍යතාවයන් විමසීම සිදු කළ බවත් එහිදී සනීපාරක්ෂක පහසුකම් සම්බන්ධයෙන් පවා අවධානය යොමු කළ බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මෙම ක්‍රීඩා පිටිය අදාල කොට්ඨාශය තුළ ක්‍රීඩා පිටියක් ලෙස නොව බල ප්‍රදේශයේ ම ක්‍රීඩා පිටියක් ලෙස ජාතික මට්ටමේ හා ජාත්‍යන්තර මට්ටමේ තරඟ පවා පැවැත්වීමට හැකියාව ඇති වන පරිදි සංවර්ධනය කළ යුතු බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා තමා කරන ලද ඉල්ලීම සලකා බලා ගරු අමාත්‍යතුමා විසින් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා දැක්වූ අවධානය කෙරේ තමන් බෙහෙවින් ස්තුතිවන්ත වන බවත්, ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා කළ ප්‍රකාශයට එකඟ වන බවත්, බල ප්‍රදේශයේ පවතින වටිනාම ක්‍රීඩා පිටිය ලෙසින් ක්‍රීඩා සමාජය සමග කළ සාකච්ඡාව සේම සභාව තුළ ද යම් සාකච්ඡාවක් පවත්වා ලැබී ඇති ප්‍රතිපාදනය වඩා ඵලදායී ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම වඩාත් සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා අදාල සාකච්ඡාව සඳහා තමන් සහභාගී වූ බවත්, මෙම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා ගත් තීරණය සම්බන්ධයෙන්සතුටු වන බවත්, අදාල සාකච්ඡාවේදී ක්‍රීඩකයන්ගේ අදහස් සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කල බවත්, එහිදී ක්‍රීඩා පිටිය සංවර්ධනය කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ක්‍රීඩා සමාජය හරහා සාකච්ඡා කර ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරි වෙත යොමු කරන ලෙසට සඳහන් කළ බවත්, ඇතැම් යෝජනා ඒ අවස්ථාවේදීම සැලකිල්ලට භාජනය වූ බවත් මෙම කාරණය වඩාත් හොඳ බැවින් සභාවට යෝජනාවක් ලෙස ඉදිරිපත් කර ඉදිරි කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා සමාජයේ ඉල්ලීම හා යෝජනා වලට අනුව දළ ඇස්තමේන්තුවක් සකස් කර එය සභාවට ඉදිරිපත් කර විධිමත් ලෙස අවශ්‍ය සංශෝධනය සමඟ සභා අනුමැතිය ලබාගැනීම සිදු කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ඒ සඳහා තවත් කාලයක් වැයවන බැවින් අදම මේ සම්බන්ධයෙන් විධිමත් සාකච්ඡාවක් පැවැත්වීම වඩාත් සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පැවැති සාකච්ඡාවේදී ක්‍රීඩකයන්ගේ අදහස් අනුව ,

01. වොලිබෝල් පිටිය ඉදිකිරීම් හා ඒ වටා දැල් වැට ඉදිකිරීම
02. පොදු වැසිකිළිය ඉදිකිරීම
03. ක්‍රීඩාගාරය පිටුපස කාමරයක් ඉදිකිරීම
04. පිට්ටනියේ බන්ට් එක පැත්තෙන් හා අනෙක් පසින් කොන්ක්‍රීට් කාණුවක් වැසුම් සමග සකස් කිරීම
05. පිවිසුම් මාර්ගය ඉදිකිරීම හා එහි බැස්ම පමණක් කොන්ක්‍රීට් කිරීම
06. පිට්ටනිය පස් යොදා පිළිසකර කිරීම.
07. ජල පහසුකම් ලබා ගැනීම (නල ජලය)
08. පිටුපස ගස් ඉතිරි කර කුඩා පඳුරු ඉවත් කිරීම යනාදී යෝජනා ඉදිරිපත් වූ බවත් එම කාර්යයන් ප්‍රතිපාදන ප්‍රමාණය අනුව ඉටු කිරීමට බලාපොරොත්තු වන බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා මේ ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමට අදහස් ප්‍රකාශ කරන අවස්ථාවේදී තමන් ජලය, විදුලිය, ජිම් එක සහිත ගෘහස්තාගාරයක්, වෙළඳ සංකීරණය සමග වාහන නැවතුම් පළාත්, හොඳ

කාණුවක් සකස් කර ජලය බැස යා හැකි පරිදි සකස් කිරීමටත්, වැසිකිළි පද්ධතියක් ස්ථාපිත කිරීමටත් සුදුසු බවට අදහස් කල බවත්, ඊට අදාල සැලැස්ම සුදුසු පරිදි සකස් කළ යුතු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා</u> ක්‍රීඩාපිටියට අදාළ master plan එකක් සකස් කර ලැබෙන ප්‍රතිපාදනය මත ප්‍රමුඛතාවය අනුව අත්‍යාවශ්‍ය අංග ස්ථාපිත කිරීම සුදුසු බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී. තවද මෙම ක්‍රීඩා පිටිය තුළ මීට පෙරත් වේදිකාවක් ඉදි කළ නමුත් එය සාර්ථක නොවූ බවත් තමා ඉදිරිපත් කළ යෝජනාවක් අනුව master plan එක සකස් කිරීම සුදුසු බව වැඩි දුරටත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

<u>ගරු සභාපති එස්.බී. කුමාරදාස මැතිතුමා</u> 2021.08.10 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I.සෙල්ලම් උපකරණයක් සවි කිරීම.**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනුරාධපුර, ගල් කුලම, වේවැල්දිගිලිය අක්කර 50 ලිපිනයේ පිහිටී මිස්සක පෙර පාසල සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ව්‍යාපෘති - පූර්ව ළමා විය යටතේ රු 50,000 ක ප්‍රතිපාදනයක් හිමි වී ඇති අතර එයින් රු 22,000 මුදලක් ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා ලබා දුන් අතර ඉතිරි ප්‍රතිපාදන මුදලින් පෙර පාසල් දරුවන්ගේ ක්‍රීඩා අවශ්‍යතාවය වෙනුවෙන් ලෑඩරයක් සකස් කර දීම සුදුසු බැවින් ඒ සඳහා බල ප්‍රදේශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II.ජල පිරිපහදු මධ්‍යස්ථානය සඳහා ජල පෙරණය මිල දී ගැනීම.**

උතුරු මැද පළාත් වාර්ෂික සංවර්ධන සැළැස්ම - 2021 (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන ) යටතේ කීරික්කුලම ජල පෙරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා රු 2,000,000 ක ප්‍රතිපාදනයක් හිමි වී ඇති අතර හඳුනාගත් ජල සම්පාදන මණ්ඩලයේ හා පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් ගෙන් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය : යටතේ මිල ගණන් කැඳවා මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**III ගරු සභාපතිතුමාගේ කාමරය සහ පෙරටු කාර්යාලය තුල වායු සමීකරණ යන්ත්‍ර ස්ථාපිත කිරීම.**

ගරු සභාපතිතුමාගේ නිල කාමරය තුල හා පෙරටු කාර්යාලය තුල වායු සමීකරණ යන්ත්‍ර මිල දී ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති බැවින් මිල ගණන් කැඳ වූ නමුත් මිල දී ගැනීමට ගිය අවස්ථාවේදී එහි මිල ප්‍රමාණය වෙනස් වී ඇති බැවින් නැවත වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ වායු සමීකරණ යන්ත්‍ර 2 ක් සඳහා මිල ගණන් කැඳවීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IV. බල ප්‍රදේශය තුල වීථි ලාම්පු අළුත්වැඩියා කිරීම.**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර ඇති වීථි පහන් අළුත්වැඩියා කල යුතු තත්වයේ පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය බල්බ 1000 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති නිර්දේශයන්ට අනුව මිල දී ගැනීම සඳහා වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**v. බ්ලොග් ගල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය සිමෙන්ති මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් බ්ලොක් ගල් වැඩපල සඳහා එහි අවශ්‍යතාවය අනුව සිමෙන්ති කොට්ට 500 ක් මිල දී ගැනීමට අවශ්‍ය බැවින් නියෝජිත ආයතනයකින් මිල දී ගන්නවානම් එම ආයතනයේ මිල ගණන් මත පමණක් පදනම් වී මිල ගණන් කැඳවීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VI. බ්ලොක් ගල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය ගල් කුඩු මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් බ්ලොක් ගල් වැඩපල සඳහා එහි අවශ්‍යතාවය අනුව ගල් කුඩු කියුබ් 250 ක් මිල දී ගැනීමට අවශ්‍ය බැවින් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා ඒ මිල ගණන් මත පදනම් වී මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ඉදිරිපත් කරන ලදී.

**VII. සංග්‍රහ කටයුතු වෙනුවෙන් පිරිසි කෝප්ප මිල දී ගැනීම.**

සංග්‍රහ කටයුතු වෙනුවෙන් දැනට පවතින පීරිසි කෝප්ප භාවිතා කිරීමට නුසුදුසු තත්වයේ පැවතීම මත පීරිසි කෝප්ප 50 ක කට්ටලයක් මිල දී ගැනීම සිදු කල යුතු බැවින් වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**VIII. ලිපි ශීර්ෂ මුද්‍රණය කිරීම.**

කාර්යාලයේ දෛනික කාර්යයන් සඳහා අවශ්‍ය ලිපි ශීර්ෂ මේ වන විට අවසන් වෙමින් පවතින බැවින් අවශ්‍යතාවය අනුව ලිපි ශීර්ෂ 5000 ක් මුද්‍රණය කිරීම රජයේ ආයතනයක් වන සංවර්ධන හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය මගින් සිදු කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IX. ප්ලාස්ටික් පුටු හා ශබ්ධ විකාශණ යන්ත්‍ර මිල දී ගැනිම.**

බල ප්‍රදේශයේ මහජනතාවගේ ඉල්ලීම් ගරු මහජන නියෝජිතයන් හරහා ඉටු කිරීම යටතේ පහත සඳහන්

ස්වෙච්ඡා සංවිධාන වෙත අවශ්‍ය ද්‍රව්‍ය එක් ඉල්ලීමකට රු 50,000 සරිලන පරිදි ලබා දීමට වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

| අනු අංකය | යෝජකයා | යෝජනාව | ඇස්තමේන්තු ගත මුදල |
|---|---|---|---|
| 01 | ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය | තාරුණ්‍යයට ජවයක් සුභ සාධන සමිතිය වෙත පුටු ලබා දීම.<br>තුරුණු ශක්ති එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය වෙත පුටු ලබා දීම<br>එක්සත් මරණාධාර සමිතිය වෙත පුටු ලබා දීම | 50,000.00 |
| 02 | ගරු මන්ත්‍රී පී.කරුණාරත්න | 270 තුලානේ තුරුවිල පුරාණ රජමහ විහාර දායක සභාව වෙත ශබ්ධ විකාශන යන්ත්‍රයක් ලබා දීම | 50,000.00 |

| | | | |
|---|---|---|---|
| | මැතිතුමා | | |
| 03 | ගරු මන්ත්‍රී ඩී.එම්.එන්.සුභාෂිණී බංඩාර මැතිනිය | ශ්‍රී අනුර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ප්ලාස්ටික් පුටු ලබා දීම | 50,000.00 |
| 04 | ගරුපී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | කලන සුභ සාධක සමිතිය වෙත සවුන්ස් සෙට් 01 හා ගෑස් ලිපක් ලබා දීම | 50,000.00 |
| එකතුව | | | 200,000.00 |

**X. පෙට්ටි බෝක්කුවක් ස්ථාපනය කිරීම.**

260 ශ්‍රාවස්තිවත්ත, රාජපක්ෂ මාවත පිවිසුම් ස්ථානයට පෙට්ටි බෝක්කුවක් ස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති රු. 244,910.78 ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව ප්‍රකාරව ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් අදාල පෙට්ටි බෝක්කුව ඉදි කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XI අවශ්‍ය ටයර් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් ZA 5033 දරණ බැකෝ ලෝඩරයෙහි 14 X 17.05 ප්‍රමාණයේ ඉදිරිපස ටයර් දෙක මේ වන විට ගෙවී ගොස් භාවිතා කල නොහැකි තත්වයේ පවතින බැවින් කඩිනමින් එම ටයර් මිල දී ගැනීමට වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීම සිදු කරන ලෙසට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XII.ජල බවුසර අළුත්වැඩියා කිරීම.**

ප්‍රාදේශීය සභාවට අයත්, RX 1718 ජල බවුසරය හා අනෙක් කහ පැහැති ජල බවුසරයේ බඳ කොටස හා ආධාරකයන් දිරාපත් වීම නිසා දෛනික කාර්යයන් වලට යොදා ගැනීම දැඩි අවධානම් සහිත වේ. එබැවින් ජල බවුසරවල දිරා ගිය කොටස් නැවත සකස් කිරීම සඳහා වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XIII. PPTA ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.**

PPTA ව්‍යාපෘතිය හරහා කෙවිඩ් 19 වසංගතය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වෙන් කර දී ඇති රු 14,00,000 ක ප්‍රතිපාදන මුදලින් ප්‍රචාරක දැන්වීම් පල කිරීම සඳහා බැනර් මුද්‍රණය කිරීමටත්, එන්නත් ගත කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රචාරණ කටයුතු සඳහා වාහන වල ඉන්ධන වියදම ප්‍රතිපාදන හිමි වූ පසු ප්‍රතිපූර්ණය කරන තෙක් සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XIV. කැමරාවක් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවේ දෛනික කාර්යයන් සඳහා අවශ්‍ය ඡායාරූප ලබා ගැනීම වෙනුවෙන් කැමරාවක් අවශ්‍ය වී ඇති හෙයින් සුදුසු පිරිවිතරයක් සකස් කර වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XV. මිනින්දෝරු සේවාව ලබා ගැනීම.**

මෙම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සභාවට අයත් ඉඩම් සභාවට පවරාගෙන හිමිකම් පත්‍ර ලබා ගැනීම සඳහා ඉඩම් මැනීම සිදු කිරීමටත් ඊට අදාල මුදල් ගෙවීමටත් මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**XVI. ගෙවූ මුදල් එම කාර්යය ඉටු නොකිරීම මත නැවත ගෙවීම.**

ප්‍රාදේශිය සභාවේ නිෂ්පාදනය කරනු ලබන බ්ලොග් ගල් 500 ක් මිල දී ගැනීම වෙනුවෙන් 2021.04.06 වන දින ලදු පත් අංක 3521 න් චාමර ප්‍රසාද් යන අය විසින් ගෙවනු ලැබූ රු.21,500.00 ක මුදලින් බ්ලොග් ගල් 250 ක් පමණක් ලබා දීමට හැකි වූ අතර ඉතිරි ප්‍රමාණය වන බ්ලොග් ගල් 250 ට අදාල රු 10,500.00 මුදල නැවත ඒ අය විසින් ඉල්ලා ඇති අතර අදාල මුදල නැවත ගෙවීමටත්, බ්ලොග් ගල් 2200 ක් මිල දී ගැනීම. වෙනුවෙන් 2021.06.10 වන දින ලදුපත් අංක 3886 න් සඳමාලි ජයවර්ධන යන අය විසින් ගෙවනු ලැබූ රු101,200.00 ක මුදලින් බ්ලොග් ගල් 700 ක් පමණක් ලබා දීමට හැකි වූ අතර ඉතිරි ප්‍රමාණය වන බ්ලොග් ගල්1500 ට අදාල රු 69,000.00 මුදල ද නැවත ඉල්ලා ඇති බැවින් එම ඉල්ලුම් කල මුදල් නැවත ගෙවීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ආර්. එම් කුමාරසිංහ මැතිතුමා</u> තුලාන මට්ටමෙන් හෝ කොට්ඨාශ මට්ටමෙන් වීථි පහන් සඳහා කණු වලට හෝ පහනකට අංකයක් ලබාදී ඇත්ද යන්නත්,වීථි පහන් ද්‍රව්‍ය සඳහා යම් වගකීම් කාලය පවතින බැවින් ඒවා විධිමත් පරිදි මාරුවීම් සිදුවන්නේද යන්නත් මෙම දත්ත කොට්ඨාශ මට්ටමෙන් හෝ පරිගණක ගත කර දත්ත පද්ධතියක් පවත්වාගෙන යන්නේ නම් සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> බ්ලොග් ගල් ලබා ගැනීම වෙනුවෙන් ගෙවූ මුදල් එම බ්ලොග් ගල් ලබා නොදීම මත නැවත ගෙවීමට අදාලව බ්ලොග් ගල් 750 ක් සඳහා රු 69,000 මුදලක් ගෙවීමට තීරණය කර ඇති බැවින් එහිදී බ්ලොග් ගලක් රු 92 ක මුදලකට ගැනෙන බවත්, එහි ගැටළුවක් පවතින බව සඳහන් කරන ලදී. තවද අදාළ බ්ලොග් ගල් මිලදී ගත් අය බ්ලොග් ගල් මිල දී නොගත්තේ, මුලින් යැවූ ගල් නිසි ප්‍රමිතියෙන් යුතුව තිබුනා වුවත් දෙවන වර ලබාදුන් ගල්වලින් 50 ක් පමණ නැවත එවීමට සිදු වූ බැවින් බවත්, තවදුරටත් අබලි වී ඇති ගල් කොටස් එම නිවසෙහි පවතින බවට අදාළ ගැනුම්කරු විසින් තමන්ට ප්‍රකාශ කළ බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> සෑම මහා සභාවක දීම ආදායම් ලෙස ලබා ගන්නා මුදල් වලින් යම් ප්‍රමාණයක් එම කාර්යය ඉටු නොකිරීම මත නැවත ගෙවීම් සඳහා සභා අනුමැතිය ලබා ගන්නා බවත් මේ අයුරින් දිගින් දිගටම රාජ්‍ය ආයතනයක් තුල විශ්වාසය පළුදු වීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවත් විශේෂයෙන්ම මහජන නියෝජිතයන් නියෝජනය කරන ප්‍රාදේශීය සභාවක් ලෙස විශ්වාසය පළුදු නොකර 100% නිවැරදිව අදාල කාර්යය ඉටු කරන ලෙසට ගෞරවයෙන් ඉල්ලා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රි කේ.ඒ ශාන්ත මැතිතුමා</u> ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා කළ ප්‍රකාශය සම්බන්ධයෙන් කණගාටු වන බවත්, ප්‍රාදේශීය සභාව කටයුතු කරන්නේ යන්ත්‍ර සූත්‍ර සමඟ බවත්, 2021 මාර්තු මස හානියට ලක් වූ බැකෝ ලෝඩරය රජයේ නීතිරීති හා නෛකිත ක්‍රියාවන් වල පවතින අපහසුකම් මත මෙතෙක් අලුත්වැඩියා කරගත නොහැකි තත්වයක සිටින බවත්, දැනට මාස කිහිපයක සිට කොරෝනා එන්නත් මර්ධන ක්‍රියාවලිය වෙනුවෙන් සභා භූමිය යොදා ගත් බැවින් නිවැරදි ධාරිතාවයට බ්ලොග් ගල් නිෂ්පාදනය ඇණ සිට ඇති බවත්, මෙම තත්ත්වය ගරු මන්ත්‍රිතුමා සාධාරණව දැකිය යුතු බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රි බී.කී.ඊ ගයාන් චාමර මැතිතුමා</u> 2021.08.10 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> බල ප්‍රදේශයේ ස්ථාපිත කරනු ලබන වීථි පහන් සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා ගන්නා අතර ඒ සම්බන්ධව අප වෙත දත්ත පද්ධතියක් ද මේ වන විට පවතින බව සඳහන් කරන ලදී.

තවද බ්ලොග් ගල් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවූ මුදල් ආපසු ගෙවීමේ දී එහි සටහන් කිරීම 750 ක් ලෙස දක්වා ඇතත්, එය 1500 ක් ලෙස නිවැරදි විය යුතු බවත් ඒ අනුව ගලක් 42 බැගින් සම්පූර්ණ රු 69,000.00 මුදලකට නැවත ගෙවීම සිදු කළ බව සඳහන් කරන ලදී.

තවද අදාල බ්ලොග් ගල් පැටවීම සිදු කරනු ලැබූ අවස්ථාවේදී ගල් වල මුළු කොටස් සුළු ප්‍රමාණයක් කැඩී තිබෙන බවත් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත එය මේ අවස්ථාවේදී නිරීක්ෂණය කළ හැකි බවත් අදාළ ගැණුම්කරු සම්බන්ධයෙන්ද ගැටළුකාරී තත්වයක් පවතින බවත් සඳහන් කරන ලදී.

අනතුරුව මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් විරෝධතාවක් පවතින්නේ ද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 අගෝස්තු මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02. 2021 සැප්තැම්බර් මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021 සැප්තැම්බර් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>2021 සැප්තැම්බර්</u>**

| | | පැය ගණන |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. එස්.පී.එම් පුෂ්පකුමාරී මිය | (පුස්තකාල සහයක) | 40 |
| 05. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහයක) | 40 |
| 06. ඩබ් තිලකරත්න මයා | (කා.කා.ස) | 40 |
| 07. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. ඩී.පී.ඩී.එන්.එල් විජේසිරි මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 13. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 60 |
| 14. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 15. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> 2021 සැප්තැම්බර් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 සැප්තැම්බර් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** **කාර්යාලය තුල මුදල් භාර ගැනීමේ කාලය ලෙස දැක්වූ ප.ව 2.00 වේලාව ප.ව 3.00 දක්වා දීර්ඝ කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අංක 2182/39-2020.ජුලි මස 03 වන දින අති විශේෂ ගැසට් පත්‍රයේ පල වී ඇති ප්‍රාදේශීය සභා රීති වල 37 වන වගන්තියේ සඳහන් පරිදි ප්‍රාදේශීය සභාවේ මුදල් ගණුදෙනු කරනු ලබන කාල සීමාව සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතු බවට සඳහන් වන බැවින් මෙම ප්‍රාදේශීය සභාවේ දෛනික මුදල් භාර ගැනීම පෙ.ව 09 සිට ප.ව 2.00 දක්වා සිදු කිරීම සුදුසු බවට 2020 සැප්තැම්බර් මස 22 වන දින තීරණ අංක 69 යටතේ සභා අනුමැතිය ලබා ගත් නමුත් පාරිභෝගික ජනතාව සඳහා වන අපහසුතාවය සැළකිල්ලට ගෙන එම කාලය පෙව 09 සිට ප.ව 3.00 දක්වා දීර්ඝ කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> පාරිභෝගික ජනතාව සම්බන්ධයෙන් අවධානය යොමු කර අදාල කාලය දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් දෛනික මුදල් භාර ගැනීමේ කාලය පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා දීර්ඝ කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** **ප්‍රාදේශීය සභාව වෙත හිමි වූ ආදායම් අදාල කාර්යය ඉටු කිරීමට නොහැකි වීම මත නැවත ගෙවීම සඳහා ලේකම් වරයා වෙත බලය පැවරීම**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ප්‍රාදේශීය සභාව වෙත හිමි වූ ආදායම් අදාල කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම මත නැවත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගත යුතු බවට සභා රීති සංග්‍රහය තුල ඇතුලත් වන නමුත් එවැනි අවස්ථා මසකට සැළකිය යුතු ප්‍රමාණයක් ඉදිරිපත් වීම මත හා එහිදි අදාල පාරිබෝගික ජනතාවට කඩිනමින් ගෙවීමේ හැකියාව අහිමි වී යන හෙයින් ඒ සියල්ල සභා ගත කරනවා වෙනුවට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තියට අනුව අදාල ගෙවීම් ආවරණ අනුමැතියට යටත්ව රු 100,000 දක්වා දැරීම සඳහා ලේකම් වරයා වෙත බලය පැවරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> ඉදිරිපත් කළ යෝජනාව කාලෝජිත වන බැවින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් බලය පැවරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** **වැඩ පරිපාලක රාජකාරිය ආවරණය කිරීම වෙනුවෙන් පුද්ගලයෙකු පත් කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අනවසර ඉදිකිරීම් පරීක්ෂාව සඳහා යොදවා සිටි වැඩ පරිපාලක බණ්ඩාර දිසානායක මහතා කාර්යාල රාජකාරි වල නිරතව සිටින බැවින් අනවසර පරීක්ෂාව සඳහා මුරකරු අධිශ්‍රේණියේ ගුණරත්න බණ්ඩාර මහතා යෙදවීම් සුදුසු බවට ප්‍රකාශ කරමින් බල ප්‍රදේශය පුරා අනවසර පරීක්ෂව සඳහා යාමට ඔවුහු වෙත බලය පැවරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර ඒ තුලින් රාජකාරී ආවරණය කිරීම පමණක් සිදු කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා අනියම් වැඩපරිපාලක තනතුරු දරණ අය ස්ථිර කිරීමේදී වැඩ පරිපාලක තනතුරේ රාජකාරි නොකිරීම ගැටළුවක් වන බැවින් අදාළ සේවකයින් දෙදෙනාම වැඩ පරිපාලක ලෙස පත් කර ස්ථිර සේවකයා රාජකාරී ආවරණය කිරීම සඳහා යෙදවීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුද වසන්ති මැතිණිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අනවසර පරීක්ෂව සඳහා මුරකරු අධි ශ්‍රේණියේ ගුණරත්න බණ්ඩාර මහතා යෙදවීමටත් බල ප්‍රදේශය පුරා අනවසර පරීක්ෂාව සඳහා යාමට ඔහු වෙත බලය පැවරීම සුදුසු බවටත්, වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 06. 2021 සංවර්ධන වැඩසටහන් - පළාත් පාලන දෙපාර්තමේන්තුව ( නව වැඩ)

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 සංවර්ධන වැඩසටහන - පළාත් පාලන දෙපාර්තමේන්තුව නව වැඩ යටතේ මෙම පළාත් පාලන ආයතනයට අදාලව පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇති බැවින් එම ව්‍යාපෘති වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කර බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධානය හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතිය | 2021 වර්ෂයට අනුමත මුදල රු. |
|---|---|---|---|
| 01 | 21/611/03/02/2005/24(i)/N/A/03 | නිදන්ගල මාර්ගය මීටර් 700 අළුත්වැඩියාව හා සංවර්ධනය කිරීම | 1,000,000.00 |
| 02 | 21/611/03/02/2005/24(i)/N/A/04 | 5 ඇල අතුරු මාර්ගය ප්‍රභාත් මහතාගේ නිවස අසල සිට මීටර් 100 ක් කොන්ක්‍රීට් කිරීම | 1,000,000.00 |
| 03 | 21/611/03/02/2005/24(i)/N/A/05 | කුඩා කවරක්කුලම පාර නුවර පාරේ සිට මීටර් 700 ක් බොරළු දමා සංවර්ධනය කිරීම | 550,000.00 |
| 04 | 21/611/03/02/2005/24(i)/N/A/06 | තරියන්කුලම නළ ළිඳ පාර මීටර් 150 ක් කුට්ටිගල් ඇතිරීම | 1,500,000.00 |
| 05 | 21/611/03/02/2005/24(i)/N/A/147 | පොතානේත්ගම විහාර මහ දේවී මාවතේ 3 වන අතුරු ග්‍රාමීය මාර්ග සංවර්ධනය කර ගැනීම වසන්ත මහතාගේ නිවසට යන අතුරු මාර්ගය | 500,000.00 |
| 06 | 21/611/03/02/2005/24(i)/N/A/148 | අශෝක මාවත මල්වතු ඔය 242 වන්නියකුලම මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම | 500,000.00 |
| 07 | 21/611/03/02/2005/24(i)/N/A/149 | වන්නිතම්මැන්නාව ගල්වල පාර සිට අශෝක මහතාගේ නිවස දක්වා අතුරු මාර්ගය කොන්ත්‍රීට් කිරීම | 500,000.00 |
| 08 | 21/611/03/02/2005/24(i)/N/A/150 | ජන උදාන ගම්මානයේ එස්.එම් \| අප්පුහාමි මහතාගේ නිවස සිට දීපාල් මහතාගේ නිවස දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම | 500,000.00 |

| | | | |
|---|---|---|---|
| 09 | 21/611/03/02/2005/24(i)/N/A/151 | කුඩා නෙළුබැඅව ආමනේ 02 ඇල මාර්ගය බොරළු යෙදීම | 500,000.00 |
| 10 | 21/611/03/02/2005/24(i)/N/A/152 | වන්නියකුලම 2 ජේන් නෝනා මාවත කුට්ටිගල් ඇතිරීම | 500,000.00 |
| 11 | 21/611/03/02/2005/24(i)/N/A/153 | පොතානේම ඉහල වැව ග්‍රාමයේ පැටී මහතාගේ නිවස අසල මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම | 500,000.00 |
| 12 | 21/611/03/02/2005/24(i)/N/A/154 | සුභදගම ප්‍රජා ශාලාව අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 500,000.00 |
| 13 | 21/611/03/02/2005/24(i)/N/A/155 | කලත්තෑව තරංග වින්කලය අසල මාර්ගය බොරළු දමා ප්‍රතිසංස්කරණය කිරීම | 500,000.00 |
| 14 | 21/611/03/02/2005/24(i)/N/A/156 | කිරික්කුලම සමන්ත මහතාගේ කඩය ඉදිරිපිට ඇති අතුරු මාර්ගය බොරළු යොදා සංවර්ධනය කිරීම | 500,000.00 |
| 15 | 21/611/03/02/2005/24(i)/N/A/157 | මහ පාලාඩිකුලම ඉත්තෑව නාලක මහතාගේ නිවස ඉදිරිපිට පාර ගල්වල දක්වා බොරළු දමා සංවර්ධනය කිරීම. | 500,000.00 |

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා නිදන්ගල මාර්ගය හා ප්‍රභාත් මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති දෙකම එකම ව්‍යාපෘතියක් ලෙස ගෙන සංවර්ධනය කරන බවට සභා යෝජනාවක් ලබා ගත් බැවින් එහි වර්තමාන තත්වය කෙබඳු ද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාළ සංශෝධනයන් සිදු කිරීමට යාමේදී එකම කොට්ඨාශයේ ව්‍යාපෘති වන බැවින් වෙනත් ව්‍යාපෘති ලබා දීමේදී මෙම ව්‍යාපෘතිය අහිමි වීමේ හැකි බවක් පෙනෙන්නට තිබු බැවින් ඉදිරිපත් වී තිබූ පරිදි අදාළ ව්‍යාපෘති ඉටුකරන බව සඳහන් කරන ලදී

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපෘති බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් වී ඇති ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීමේ යෝජනාව ඒකමතිකවම සභා සම්මත විය.

**07. ගරු මන්ත්‍රීවරුන් හරහා මහජන ඉල්ලීම් ඉටු කිරීම.**

ගරු මන්ත්‍රී වයි.එම් ගාමිණී බණ්ඩාර මැතිතුමා ප්‍රදේශයේ ජනතාවගේ මහජන ඉල්ලීම් මත ගරු මන්ත්‍රීවරුන් හරහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වූ වැඩසටහනේ තමන් විසින් ඉල්ලා තිබූ ස්වයං රැකියා උපකරණ ලබාදීමේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේ විවිධ අපහසුතා පවතින බැවින් එම යෝජනාව වෙනුවට කලත්තෑව රන්තරු ප්‍රජාමූල සංවිධානය වෙත පුටු ලබා දීමේ යෝජනාව ඇතුළත් කර දෙන මෙන් ඉල්ලා සිටිමින් එසේ ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා අදාළ යෝජනාව ස්ථිර කරන ලදී

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ස්වයං රැකියා උපකරණ ලබා දීමේ යෝජනාව වෙනුවට රන්තරු ප්‍රජා මූල සංවිධානය වෙනුවෙන් පුටු ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08. නිරෝධායනය වන පවුල් සඳහා ඖෂධ ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නැගෙනහිර නුවරගම් පළාත ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය මගින් කොවිඩ් 19 ආසාදිත රෝගීන් සඳහා දැනට ඖෂධ සහ ආයුර්වේද නිවාරණ ක්‍රම ලබා දෙන අතර මේ අවස්ථාවේ රෝගීන් ගේ ඉල්ලීම අනුව ප්‍රමාණවත් ඖෂධ ලබාදීම ඔවුන් හට ගැටළුවක්ව පවතින නිසා ප්‍රාදේශීය සභා සීමාව තුල රෝගීන්ගේ සුව සැලසීම සඳහා අවශ්‍ය ඖෂධ ලබාදීමට සහයෝගය දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත් මේ වන විට covid වසංගතය වැළඳී ඇති රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමේදී මෙ වන තෙක් කිසිදු රෝගියකු මරණයට පත්වී නොමැති බවට ඔවුන් තහවුරු කරන බවත් ප්‍රකාශ කරමින් මේ සඳහා හිමිවන ප්‍රතිපාදන සීමිත බැවින් සභාව මැදිහත් වී අදාළ ඖෂධ ලබාදීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී එම් කේ.ජී ජී කුමාරිහාමි මැතිනිය තමන් එම යෝජනාව ස්ථිර කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා යෝජනාව හොඳ නිසා කල් ගත වීමකින් තොරව ලබා දීම සිදු කළ යුතු බැවින් ඒ සඳහා නිශ්චිත මුදල් ප්‍රතිපාදනයක් වෙන් කළ යුතු බවත් මේ සඳහා අයවැය තුළ අවශ්‍ය ප්‍රමාණයට මුදල් වෙන් වී ඇතිද නැතිද යන්නත් මේ සම්බන්ධයෙන් තමන් අයවැය සාකච්ඡාවේදී කරුණු සඳහන් කළත් ඒ කෙරේ අවධානය යොමු නොකළ නමුත් වර්තමානයේ එම අවශ්‍යතාව පැන නැගී ඇති බවත් සඳහන් කරන ලදී. තවද මෙම වසංගත තත්ත්වය මේ වන විට බල ප්‍රදේශය තුළ ඉතා දරුණු අතට පත්වී ඇති බවත්, ශ්‍රාවස්තිපුර කොට්ඨාශය තුළ පුද්ගලයින් හතර දෙනෙකු මේ වන විට මිය ගොස් ඇති බවත්,මේ ගැටලුව තුළ අප සභාවක් ලෙස අපගේ යෝජනාව කුමක්ද අප ගන්නා පියවර කුමක්ද යන්න සාකච්ඡා කර අවම වශයෙන් රුපියල් ලක්ෂ පහක මුදලක් හෝ වෙන් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර මෙම මුදල වෙනත් වියදම් නතර කර හෝ දරන්නේ නම් සුදුසු බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය ඉදිරිපත් කළ යෝජනාව ඉතාම කාලෝචිත වන බැවින් දැනට වර්තමාන තත්වය අනුව covid වසංගත තත්ත්වය දේශීය වෛද්‍ය විද්‍යාව මගින් බොහෝ දුරට මර්ධනය වන තත්වයක් පවතින බැවින් ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සඳහන් කළ පරිදි බල ප්‍රදේශයේ මෙම වසංගත තත්වය දීර්ඝ ව්‍යාප්තියක් පෙන්නුම් කරන බවත් මෙවැනි වෙලාවක මෙම යෝජනාව සඳහා සභාවක් ලෙස සභා බල ප්‍රදේශය තුල පවතින ඖෂධ වර්ග සොයා දිය හැකි බවත් නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි නිරෝධායනය වන නිවාස නගර සභාව විසින් විෂබීජ හරණය කරන බැවින් ජනතාව විසින් ප්‍රාදේශීය සභාව මගින් ද එවැනි වැඩ සටහනක් ක්‍රියාත්මක කරනු ඇතැයි විශ්වාස කරන බවත්, ඊට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍යයන් ප්‍රාදේශීය සභාව සතුව පවතින බැවින් කොරෝනා වසංගතය වැළඳෙන රෝගීන් සිටින නිවාස නිරෝධානය වී නැවත පැමිණීමට පෙර විෂබීජහරණය සිදු කර දීමට කටයුතු කරන ලෙසත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද නිරෝධායනය වන නිවාස වලට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ලබාදෙන සහන මල්ල අදාළ පිරිසට ලැබීමේදී විශාල ප්‍රමාදයක් සිදු වන බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් එම ද්‍රව්‍ය ලබා දීමේදී නිරෝධායනය අවසන් වීම පවා සිදුවන අවස්ථා පවතින බවත් පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ සෞඛ්‍ය බලධරයා ගරු සභාපතිතුමා වන බැවින් මේ පිළිබඳ අවධානය යොමුකර සහන මල්ල අවශ්‍ය අවස්ථාවේදී ජනතාවට ලබාදීමට පියවර ගන්නා ලෙසද සඳහන් කරන ලදී

තවදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී .ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය තමන් අදහස් දක්වන අවස්ථාවේ දීත්, corona ව්‍යාප්තිය සිදුවන බැවින් සඳහන් කළ කරුණු ඉතා ඉක්මනින් සිදු කිරීමට කඩිනම් පියවර ගන්නා ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටින ලදී.

<u>ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා</u> විෂබීජහරණය සිදු කිරීම සඳහා ප්‍රාදේශීය සභා සේවකයින් යොමු කළත් එය මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ උපදෙස් පිළිපැදීමකින් තොරව සිදු නොකරන ලෙසට දැනුම් දී ඇති බවත්, ඒ පිළිබඳ කෙතරම් බලතල තිබුනත් ක්‍රියාත්මක කිරීමේ අවදානමක් පවතින බවත්, ආහාර මල්ල ලබා දීමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ නිර්දේශය මත පමණක් ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කළත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ කාර්යබහුලතාව මත එය ප්‍රමාද වන බැවින් කොවිඩ් මර්ධන කමිටුවේ දී සිදු කල සාකච්ඡාවට අනුව ග්‍රාමසේවක මහතාගේ නිර්දේශය මත ආහාර මල්ල ලබාදීමට කටයුතු මේ වන විට කෙරීගෙන යන බවත්, ඉදිරියේදී මෙම කාර්යය වඩා ඉක්මනින් සිදු වනු ඇති බවට අපේක්ෂා කරන බවත් සඳහන් කරන ලදී.

තවද ප්‍රාදේශීය සභාව සතුව පවතින වත්කම ඉතා අවම බැවින් මේ වෙනුවෙන් විශාල වියදමක් දැරීමේ හැකියාව නොමැති බවත් දැනට තිබෙන ප්‍රමාණය මත අවශ්‍ය උපරිමයෙන් සිදු කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරන ලද අතර සභාවක් ලෙස එන්නකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක දැන්වීම් කිරීමට විශාල ඉන්ධන ප්‍රමාණයක් වැය වූ වත් ඉදිරියේදී සෞඛ්‍ය ආරක්ෂිතව හැසිරීම සම්බන්ධයෙන් උපදෙස් මාලාවක් ප්‍රචාරණය කිරීමට අපේක්ෂා කරන බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> දේශීය ඖෂධ ලබාදීම වෙනුවෙන් ගෙන ආ යෝජනාව ඉතාම කාලෝචිත බවත් දේශීය ඖෂධ කොරෝනා මර්ධනයට ඉවහල් වන බව මේ වන විට පත්‍යක්ෂ කර පවතින බවත්, මෙම ඉල්ලීම නැ.නු.ප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් ඉල්ලීම් කර ඇති නමුත් නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළද අදාළ ඖෂධ ලබාදීමට කටයුතු කරන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ලක්ෂ 3 ක ප්‍රතිපාදනක් හෝ ලබාදීම සුදුසු බවද සඳහන් කරන ලදී.

තවද කොරෝනා වසංගතය වැළඳුණු රෝගීන් රෝහල් ගත කිරීමට ප්‍රමාද වන අවස්ථා මෙන්ම ප්‍රායෝගික ගැටළු බොහෝමයක් සිදු වන අවස්ථා පවතින බවත් ප්‍රාදේශීය සභාවක් ලෙස මෙම ගැටළු වලට විසඳුම් ලබා දීමට හැකියාව පවතී නම් වඩාත් යෝග්‍ය බවත් ඒ අතර ආහාර මල්ල ලබාදීමේ අකාර්යක්ෂමතාවයත් පානීය ජලය නොමැති වීමේ ගැටලුව ද මේ වන විට උද්ගත වී ඇති බවත් සඳහන් කරන ලදී.

තවද පසුදිනක නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සෞඛ්‍ය මධ්‍යස්ථානය තුළ කොරෝනා පරීක්ෂණ සිදුකරන අවස්ථාවේදී ජනතාව කිසිදු සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයකින් තොරව තැනින් තැන සිටි නමුත් කවර පිරිසට කොරෝනා වැළඳී ඇතිද නැතිද යන වග සොයාගත නොහැකි තත්ත්වයක් පැවතියා සේම මාර්ග දෙපස ජනතාව එක් රැස්වී සිටි බවත් මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කළ යුතු බවත්, සෞඛ්‍ය අංශය මේ කෙරෙහි දක්වන සැලකිල්ල සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත් සඳහන් කරන ලදී.

තවද කොරෝනා වසංගත තත්ත්වය වෙනුවෙන් දැනුවත් කිරීම මූලික වශයෙන්ම සිදු කළ යුතු බව ද සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා</u> හිදෝගම කොට්ඨාශය තුල නිවාස 15 පමණ නිරෝධානය කර ඇති බවත් එහිදී ඇතැම් පුද්ගලයින් වෙත ආහාර මල්ල නොලැබී තිබෙන නමුත් ඊයේ දිනය වන විට ඒ මලු සියල්ල ලැබී ඇති බවත්, මේ වන විට තම කොට්ඨාශ තුල දෙවරක් ම නායක ස්වාමීන් වහන්සේ සමඟ ප්‍රචාරණ කටයුතු සිදු කළ බවත්. ඉදිරියේදී ද එලෙස සිදු කිරීමට යෝජිත බවත්, සඳහන් කරන ලදී.

තවද කොට්ඨාශයේ කොවිඩ් කමිටුව මගින් මරණාධාර සමිති ගොඩනැගිල්ල තුළ කොවිඩ් වැළඳී ඇති රෝගීන් නිරෝධායනය කිරීම සඳහා යොදා ගැනීමට තීරණය කර තිබෙන බැවින් ප්‍රාදේශීය සභාව සතු ජයබිම උත්සව ශාලාවෙන් ඉවත් කල ඇඳන් එම ස්ථාන සඳහා ලබාදීමේ හැකියාවක් පවතින්නේ නම් වඩාත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී. තවද රෝගය වැළඳුණු රෝගීන් සිටින පවුල් සඳහා සභාවේ හැකියාව අනුව කුමක් හෝ යහපත් දෙයක් සිදු කිරීමේ හැකියාව පවතින්නේ නම් වඩාත් සුදුසු බව ද කරුණු දක්වමින් සඳහන් කරන ලදී

ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා පෙ.ව 11.55 සභා ගර්භයෙන් පිටව යන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රීතුමා සිදුකරන ලබන ස්වාධීන කාර්යයන් වෙනුවෙන් බෙහෙවින් ස්තූතිවන්ත වන බවත් මෙවැනි ස්වාධීන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා සෞඛ්‍ය අංශය හරහා ඉල්ලීමක් නොමැති බැවින් එසේ නොමැතිව අදාල ඇඳන් ලබාදීමේ හැකියාවක් නොමැති බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> දැනට නෙළුබැව රෝහල් නිල නිවාසය කොරෝනා රෝගීන් සඳහා ලබා දීමට තීරණය කර ඇති බවත්, එම ස්ථානයට අදාළ උපකරණ ලබාදීමේ හැකියාවක් පවතින්නේ නම් එය උචිත බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී පී බන්දුලසේන මැතිතුමා</u> මේ වන විට කොරෝනා වසංගත තත්ත්වය අප ආසන්නයටම පැමිණි ඇති අවස්ථාවක අප ඉදිරි පියවර ගන්නේ කෙසේද යන්න අවධානයෙන් සිටිය යුතු බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා දේශීය වෛද්‍ය ක්‍රමය අගයන පුද්ගලයෙකු ලෙස එහි වටිනාකම දන්නා බවත් රාවණා රජතුමාගේ කාලයේ සිට පැවත එන හෙළ වෙදකමට හිමිකම් කියන අප කිසි දිනක විදේශ එන්නත් කිරීමකට යා යුතු නොවන බවත් දේශීය වෙදකම අනුගමනය කරන කිසිදු පුද්ගලයෙකුට නොමෙරී බෙරීමේ හැකියාව පවතින බවත් සඳහන් කරන ලදී.

තවද අවශ්‍ය ඖෂධ ලබා ගැනීම වෙනුවෙන් නිශ්චිත මුදලක් වෙන් කරගත හැකි වුවද මෙහිදී අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙනවාද මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනවාද යන්න නිශ්චිත තීරණයකට එළැඹිය යුතු බැවින් ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණියගේ ස්ථීරත්වය තුල රුපියල් 500,000 ප්‍රතිපාදනයක් නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ටාශය හා නැ.නු.ප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යන දෙකම ආවරණය වන පරිදි ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද මරණයක් සිදු වූ අවස්ථාවක එහි භූමිදාන කටයුතු වෙනුවෙන් ගමේ මරණාධාර සමිතිය මුදල් ලබා දුන්නද මෙම අවස්ථාවේ දී කොවිඩ් රෝගය වැළඳීම හේතුවෙන් සිදුවන මරණ භූමිදානය කිරීමක් සිදු නොවන බැවින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මරණයක් සිදු වූ පසු අප කුමක් කරන්නේද යන්න පිළිබඳ තීරණයක් කල්වේලා ඇතිව ලබාගෙන තිබුණහොත් වඩාත් හොඳ බවට තමන් අදහස් කරන බවත් ප්‍රකාශ කරන ලදී

තවදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ඩී .පී බන්දුලසේන මැතිතුමා ප්‍රාදේශීය සභාවක් මගින් ජනතාව දැනුවත් වීම පිණිස ප්‍රචාරණ කටයුතු සිදු කළත් රෝගය වැළඳුණු බවට තහවුරු වීමෙන් පසුත් ඇතැම් පුද්ගලයෝ තම පෞද්ගලික අවශ්‍යතාවයන් සමාජ තුළින්ම ඉටු කර ගෙන අවසානයේ තම නිවසට වී සිටින බවත්, මේ සම්බන්ධව අප කුමක් කරන්නේද යන්නත්. ඔවුන් දැනුවත් කරන්නේ කෙසේද යන්නත් ගැටලුවක් පවතින බවත් සඳහන් කරන ලදී.

තවද ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කළත් එතුමාගේ නායකත්වය කුමන තීන්දු තීරණ ගත්තත් ඔහු කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ යහපත් ප්‍රතිචාර දැක්වූ බවත් අද දේශීය වෛද්‍ය විද්‍යාවට ජනතා විමුක්ති පෙරමුණ නිගා කරද්දි ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා හෙළ වෙදකම අගය කිරීම සම්බන්ධව විශේෂයෙන් ස්තූතිවන්ත වන බවත් සඳහන් කරන ලදී.

තවද ප්‍රාදේශීය සභාවක් ලෙස පානීය ජලය සැපයීම සම්බන්ධයෙන් බලය අපට පනත මගින් පැවරී තිබියදී එක්තරා රජයක් විසින් ප්‍රාදේශීය සභාවට ජල බවුසරයක් ලබා නොදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දුන් බවත්, එම ආයතනය තුලින් ජනතාව විසින් ජල අවශ්‍යතාවය ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉන්ධන නොමැති බව සඳහන් කරන බවත් මෙය ප්‍රධාන පෙළේ නායකයන් තේරුම් නොගන්නේ මන්ද යන්නත් මෙම ජල බවුසර ප්‍රාදේශීය සභාව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතු බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද ජයබිම උත්සව ශාලාවේ පැවති ඇඳන් නිරෝධායන මධ්‍යස්ථානයට ලබාදීමට ඉල්ලීමක් කළත් එම ශාලාව බදු නොදී අප සතුව පැවතියා නම් එය මෙම කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ඉතා අත්‍යවශ්‍ය

කාර්යයක් සඳහා යොදා ගැනීමේ හැකියාව පැවති බවත් මේ සම්බන්ධයෙන් අවධානයෙන් සිටිය යුතු බවත් සඳහන් කරන ලදී.

අනතුරුව දැඩි අවදානමක් සහිත මෙම කාලය තුළ වෛරස් තත්ත්වය මැඩලීම වෙනුවෙන් අනෙකුත් සංවර්ධන ක්‍රියාදාමයන් මඳකට හෝ නතර කර අවශ්‍ය ප්‍රතිපාදන සහා අරමුදලින් වෙන් කිරීමටත් පරිපාලනය පැත්තෙන් අදාළ නෛතික තත්වයන් ක්‍රියාවට නංවන ලෙසත්, එහි ප්‍රසාදය කුමන පුද්ගලයෙකුට හිමි වුවද ගැටළුවක් නොමැති බව ප්‍රකාශ කරමි ඒ සඳහා සාධනීය මැදිහත්වීමක් ලබා දෙන ලෙසත්, යෝජනාව වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන 2021 වර්ෂයේ අයවැය තුළ වෙන්කර ඇති 1501 සමාජ සේවා ගෙවීම්, වැය ශීර්ෂයෙන්,1907 දිළිඳු සහන ගෙවීම් වැය ශීර්ෂය තුළින් හා 1605 මදුරු සහ කෘමි පාලනය කිරීමේ ගෙවීමේ ශිර්ෂ වලින් ලබා ගෙන එක් කොට්ඨාශයකට රුපියල් ලක්ෂ 5 ක් වෙන් කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර සෑම කාර්යයක්ම සෞඛ්‍ය උපදෙස් මත සිට කටයුතු කරන ලෙසද සඳහන් කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී .

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> දාර්ශණික වේ ගුවේරා මහතා ලෝකයේ සිටින ධනවත්ම පුද්ගලයාගේ වත්කම්වලට වඩා එක් මිනිස් ජීවිතයක් වටිනා බවට ප්‍රකාශ කර ඇති බවට සඳහන් කරමින් මුළු රටම පාථ පක්ෂ භේද කුල මල සියල්ලත්. ආර්ථික බලතල හා බුද්ධිමය බලතලත්, තුල නොව ජීවිතය පවත්වා ගන්නේ කෙසේද යන්න ගැටළුවට මුහුණ දී සිටින බවත්, ඇතැම් විට විවිධ ස්ථාන වල මරණයට පත් වී ඇඳ වැටෙන අවස්ථා පවතින්නා සේම මුළු රටම රෝග භීතියෙන් ඇලලී සිටින බවත්, පවුල් පිටින් අන්ත අසරණ තත්වයට පත්ව සිටින අවස්ථාවක ප්‍රාදේශීය සභාව සතුව පවතින වගකීම වෙනුවෙන් අප මැදිහත් වී රජය සමඟ සාකච්ඡා කර සංවර්ධන කටයුතු මඳකට නතර කර මිනිසුන් ජීවත් වීමේ අරගලය වෙනුවෙන් සාධණීය මැදිහත් වීමක් සිදු කල යුතු බව සඳහන් කරන ලදී.

තවද පළමුවන කොරෝනා රැල්ලේ දී අතිශය සාර්ථක ලෙස රෝග පාලනය සිදු කල සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරින් සියලු දෙනා මාරු කර ඇති බවත් එය ඔවුන්ගේ සාර්ථකත්වය නිසාද අසාර්තකත්වය නිසාද, යන්න නොදන්නා මුත්, මේ වන විට අදාළ කොරෝනා මර්ධන වැඩපිළිවෙල අසාර්ථක වී ඇති බවත්, මේ රට සති දෙකකට හෝ වසා දැමීම සිදු කළ යුතු බව සඳහන් කරමින් ඒ පණිවිඩය ජනාධිපතිතුමා වෙත දැනුම් දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද නිරෝධායනය වන පවුල් සඳහා ආහාර මල්ල ලබාදීම වෙනුවෙන් ගත් තීරණය හොඳ මුත් තීරණයට එළඹෙන අවස්ථාවේදී පැවති මිලට වඩා වර්තමානයේ ද්‍රව්‍ය වල මිල ගණන් වැඩි වී ඇති බැවින් වර්තමාන මිල අනුව වෙන්කර ඇති මුදල වැඩි කර අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කරන ලෙසත්. අමුද්‍රව්‍ය පවුල් වල සිටින සාමාජිකයන් ගණන අනුව ගණනය කිරීමට තීරණය කළ යුතු බවත්. ඇතැම් පවුල් වලට මෙම ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණත් නොවන අවස්ථා පවතින බැවින් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවක් ලෙස අවධානය යොමු කර ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමිය මැතිනිය සඳහන් කළ පරිදි කුමන හෝ වැඩපිළිවෙළක් දියත් කරන්නේ නම් වඩාත් යෝග්‍ය බවත් එහිදී අවම වශයෙන් පවුලකට හාල් කිලෝ ග්‍රෑම් දහයක් හෝ ලබා දීමේ හැකියාව ඇත්නම් සුදුසු බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් මුතුන් මිත්තන් ගෙන ආ ඒ උරුමය යම් යම් දේශීය වෛද්‍යවරුන් යයි කියා ගත් උන්මත්තකයන් ට ප්‍රචාරණය දී පැණි සෑදීමට දී තිබුණත් එය අද වැලලීමට සුදුසු තත්ත්වයට පැමිණ ඇති බවත් ඒ සඳහා දේශීය වෙද උරුමය පළි නැති බවත්, අද වන විට දේශීය වෛද්‍ය භාවිතයට නැඹුරු වීම හා ඒ තුළින් හොඳ ප්‍රතිඵල භුක්ති විඳින බවත් ඒ සඳහා අප ධෛර්යය සැපයිය යුතු බවත් සඳහන් කරමින් නිරෝගි අනාගත පරපුරක් වෙනුවෙන් අප වෙහෙස විය යුතු වනවා සේම ප්‍රතිපාදන වැය කිරීම ද කළ යුතු බවත් එහි ප්‍රතිඵලයෙහි වටිනාකම වචනවලින් ප්‍රකාශ කිරීමට පවා නොහැකි බවත් ප්‍රකාශ කරමින් ඉදිරිපත් වූ යෝජනාවට සහයෝගය ලබාදෙන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> ප්‍රාදේශීය සභාවක් ලෙස දේශීය ඖෂධ වට්ටෝරු ලබා දීම වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දීම ඉතා හොඳ බැවින් හැකි උපරිම මුදලක් වෙන් කිරීම සුදුසු බවත් රටේ පවතින අයහපත් තත්ත්වය තුළ වැඩි වශයෙන් වයස අවුරුදු 60 ඉක්මවූ එන්නත් කරණයට ලක් නොවූ පිරිස මණයට පත් වන

බැවින් එන්නත් කරන විට අදාළ දැනුවත් කිරීමට ගරු මන්ත්‍රීවරුන් මැදිහත් වන්නේ නම් වඩාත් යෝග්‍ය බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර එම කායීයන් තුළ සිදු වන මරණ සැළකිය යුතු ප්‍රමාණයක් අවම කරගත හැකි බවද සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා ප්‍රදේශය තුළ එකතු කළ හැකි අමුද්‍රව්‍ය එකතු කිරීමකට ලක්කර සෞඛ්‍ය අංශයට ලබාදීමේ හැකියාව පවති නම් සුදුසු බවත් ජනතාවගේ නිරෝගීත්වය වෙනුවෙන් සභාව සතු ප්‍රතිපාදන වෙන් කර යම් කැපවීමක් ප්‍රාදේශීය සභාව විසින් දරමුයි යන්න ප්‍රකාශ කරන ලදී.

තවද ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා අදහස් දැක්වීමේදී තමන් හොඳ නමුත් පක්ෂය හොඳ නැති බවට නිරන්තරයෙන් අදහස් දැක්වුවත් තමා සිදු කරන කායීන් , අදහස් හා ක්‍රියාවන් සියල්ල තම පක්ෂයේ මගපෙන්වීම යටතේ පමණක් සිදුකරන බවත්, ඒ සියල්ල පෞද්ගලික නොමැති බවත්, දේශීය වෙදකමට ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වූ බවට ප්‍රකාශ කළත් දේශීය වෙදකමට නැති විද්‍යාත්මක පදනමක් නොමැති ආයුර්වේද වෙදකමේ නොමැති පැණිය සම්බන්ධයෙන් තම පක්ෂය විරෝධතා දැක්වීම පමණක් සිදු කළ බවත් ඒ සියල්ල මේ වන විට ඔප්පු වී ඇති බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා කොවිඩ් වසංගතයත් සමඟ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විශාල වෙහෙසක් මෙන්ම මුදල් යෙදවීමද සිදු කරන බවත්, ඒ සම්බන්ධයෙන් මහ සභාවට මෙන්ම ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වෙහෙසෙන ගුණරත්න බංඩාර මහතා වෙත ද විශේෂ ස්තූතියක් පිරිනමන බවත්, යහලේගම තුලානය තුල දස වතාවක් පමණ ප්‍රචාරණ කටයුතු සිදු කල බවත්, තම කොට්ඨාශය තුල මරණ දෙකක් සිදු වී ඇති බවත්, සඳහන් කරන ලදී.

තවද තමා මේ වෙනුවෙන් වී හෝ හාල් නොමැති නිවාස සඳහා හාල් කිලෝ ග්‍රෑම් 10 බැගින් ලබා දීමට කටයුතු කර ඇති බවත්, නිරෝධායනය වන නිවාස වල සිටින ජනතාව නිරෝධායනය වන පළමු වන දිනට පසු දිනම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ලබා දෙන ආහාර මල්ල බලාපොරොත්තු වන බවත්, ජනතාව මෙය තේරුම් ගෙන සාධාරණව සිතිය යුතු අවස්ථා පවතින බවත්, ප්‍රාදේශීය සභාව මගින් හාල් ලබා දීම සිදු කරනවාට වඩා එළවළු මල්ලක් ලබා දීමේ හැකියාව පවතින්නේ නම් සුදුසු බවත්, නාච්චාදුව ව්‍යාපාරය තුලින් පොල් ගෙඩි යම් ප්‍රමාණයක් එකතු කර ගැනීමේ හැකියාව පවතින බැවින් , එයද ජනතාවට ලබා දීමේ හැකියාව පවතින්නේ නම් වඩාත් සුදුසු බවත් සඳහන් කරන ලදී.

තවද ආයුර්වේද වෛද්‍ය තුමා සමඟ කතා කර අවශ්‍ය ද්‍රව්‍ය මොනවාද යන්න විමසා විස්තරයක් ලබා දෙන්නේ නම් අදාල ද්‍රව්‍ය රැස් කර දීමේ හැකියාව පවතින බවත්, සඳහන් කර පසුගිය දිනවලදී නිරෝධායනය කර අවසන් කල නිවාස විෂබීජ හරණය සිදු කිරීම සම්බන්ධයෙන් සියළු දෙනාට ස්තූති වන්ත වන බවත්, ඒ තුල එම ජනතාවට විශාල සහනයක් සැළසුණු නමුත් ඒ සඳහා සභාවේ සේවකයන් යෙදවීමේදී ටැංකි 4,5 ගැසීමේදී අසනීප වන පුද්ගලයන් නම් නොඑවන ලෙසත්. අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා දෙන්නේ නම් තමන් අදාල කර්තව්‍ය ගම් වාසීන් සමඟින් සිදු කර ගැනීමට කටයුතු කරන බවත්, සඳහන් කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී සුභාෂිණී බණ්ඩාර මැතිනිය දේශීය වෛද්‍ය විද්‍යාව භාවිතයට ගන්නවා සේම රාජතාන්ත්‍රික මට්ටමින් විදේශීය ඖෂධ ලෙස එන්නත්කරණයට ලක් වීම කෙරේ අවධානය ලක්වීම හොඳ බවත්, ඒ සඳහා සියළු දෙනා සහභාගී කරවීම සිදු කල යුතු බවත්,

ප්‍රාදේශීය සභාවට අයත්, මේ වන විට බදු දී ඇති නෙළුබැව ජයබිම උත්සව ශාලාව බදු දුන් පුද්ගලයින් සමඟ සාකච්ඡා කර ලබා ගෙන එය නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීමට පියවර ගන්නවානම් සුදුසු බවත්, ඒ තුලින් ප්‍රාදේශීය සභාව මැදිහත් වී යමක් කරා වන බවත්, සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රීතුමියගේ අදහස හොඳ මුත් සෞඛ්‍ය අංශය මගින් මෙතෙක් ඒ පිළිබඳ දැනුම් දීමක් හෝ දැනුවත් කිරීමක් සිදු කර නොමැති බවත්, එසේ ඉල්ලීමක් ලද හොත් එහි බදු කරු සමඟ සාකච්ඡා කර යම් තීරණයකට එළඹීමේ හැකියාව පවතින බවත්, දැනට පාලාඩිකුලම යොවුන් සේනාංකය තුල මේ වන විට නිරෝධායන මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇති බැවින් කොවිඩ් කමිටුව මගින් ගන්නා යම් යම් තීරණ මත අප ඉදිරි පියවර ගනිමුයි යන්න ප්‍රකාශ කරන ලදී.

තවද ගරු උප සභාපතිතුමා ඇතුළුව ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනා නිරෝධායනය වන පවුල් සඳහා ඖෂධ ලබා දීම වෙනුවෙන් දැක්වූ අදහස් හා යෝජනා වලට එකඟ වීම සම්බන්ධයෙන් ස්තූති වන්ත වන බවත්, ඒ සඳහා උපරිම ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09. ප්‍රජා ශාලාව සඳහා සෙවිලි තහඩු ලබා දීම.**

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගරු මන්ත්‍රී බී.බී. ඊ ගයාන් චාමර මැතිතුමාගේ කොට්ඨාශයට අයත් කීරික්කුලම බොරළු වල දක්වා දිවෙන ඥාණික්කුලම ශ්‍රමදාන මාවතේ පිහිටි ක්‍රීඩා පිටියට අයත්, ප්‍රජා ශාලාව අංග සම්පූර්ණ වූ නමුත් වහලය පිළිසකර කල යුතු තත්වයේ පවතින බැවින් ගම් වාසීන් විසින් මහජන නියෝජිතයන් වෙත එම ඉල්ලීම සිදු කර ගරු මන්ත්‍රීවරුන් 3 දෙනෙකුගේ විමධ්‍යගත මුදල් ලබා දීමට එකඟ කර ගනිමින් දිස්ත්‍රික් සැළසුම් කමිටුවේදී අනුමත කරගෙන ඇතත් ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් මත ප්‍රජා ශාලා සංවර්ධනය වෙනුවෙන් මුදල් ලබා නොදීමට තීරණය කර ඇති බැවින් එම විමධ්‍යගත මුදල් යෙදවීම මදකට නතර වී ඇති බවත්, මේ පිළිබඳ කොට්ඨාශයේ සංවර්ධන නිළධාරී තුමිය හා සහකාර අධ්‍යක්ෂ තුමාත් (සැළසුම්) මේ සම්බන්ධයෙන් තමාව දැනුවත් කල බවත්,සඳහන් කරමින් එය සභාවේ විශාල වත්කමක් බැවින් එළඹෙන වර්ෂා කාලයට පෙර අවශ්‍ය ඇස්බැස්ටෝස් තහඩු ලබා දීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීම වෙනුවෙන් ඇස්බැස්ටෝ ශීට් ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙම ඉල්ලීම මීට ඉහතදී තමා වෙතද ලැබුණු බවත්, අදාල ගම්වාසීන් ශ්‍රම දායකත්වය ලබා දෙන බැවින් ඇස්බැස්ටෝ ශීට් පමණක් ලබා දීම ප්‍රමාණවත් වන බව ප්‍රකාශ කරමින් ප්‍රතිපාදන සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත්, ප්‍රතිපාදන හිමි වූ පසු අදාල ඇස්බැස්ටෝ ශීට් ලබා දීමේ හැකියාව පවතින බව සඳහන් කරමින් ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඇස්බැස්ටෝ ශීට් ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය ප.ව 12.40 සභා ගර්භයෙන් පිටව යන ලදී.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 අගෝස්තු මස 10 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 ජූලි  මස  ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**කාරක සභා අවස්ථාව බවට පත් වීම.**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මහ සභාව කාරක සභා අවස්ථාව බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඒ අනුව සභාවේ පැවති යම් යම් ගැටළු සම්බන්ධයෙන් ලේකම්වරයාගෙන් විමසීම සඳහා මහ සභාව කාරක සභා අවස්ථාව බවට පත් විය.

PPTA ව්‍යාපෘතිය සම්බන්ධයෙන් හා විගණන විමසුම සම්බන්ධයෙන් ද, මාසික ආදායම් වියදම් වාර්තා සම්බන්ධයෙන් ද පැවති ගැටළු පිළිබඳ දීර්ඝ සාකච්ඡාවකින් පසුව ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමාගේ හා ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිනියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් විය.

**ඒ) රැස්වීම් කැදවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම සම්බන්ධ සාකච්ඡාවක් පවත්වා ඒවා පැනවීමට තීරණය කල නමුත් එම යෝජනාව සභාවට ඉදිරිපත් නොකලේ මන්ද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා එහි යම් යම් ගැටළු කිහිපයක් පවතින බැවින් තව දුරටත් අධ්‍යයනය කර පැනවිය යුතු අතුරු ව්‍යවස්ථා නිවැරදිවම හඳුනාගත් පසුව සභාවට ඉදිරිපත් කර එකවරම සියළු අතුරු ව්‍යවස්ථා පැනවීමට සභා තීරණයක් ගනිමුයි යන්න ප්‍රකාශ කරන ලදී.

අනතුරුව බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2021.08.20  වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 01.25 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2021.09.22 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

.....................................
බී.එච් ප්‍රදීප් නිශාන්ත
ලේකම්,
නැ.නු.ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

............................................
එස්.බී කුමාරදාස මැතිතුමා
සභාපති ,
නැ.නු.ප්‍රාදේශීය සභාව,
විජයපුර.